පොතුවිල් ප්‍රාදේශිය සභාව
අම්පාර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 19 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2011 මැයි 16 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 අගෝස්තු 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 . මතය .

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පොතුවිල් ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මං දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) රු.1,836,250 ක් වූ එකතු කළ අගය මත බදු ආපසු නොගෙවා දීර්ඝ කාලයක් තිස්සේ තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි .

---

(ඇ) එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන විසින් 2006 වර්ෂයේදි පරිත්‍යාග කරන ලද සීසැමේ යන්ත්‍රය අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් පිළිබිඹු නොකොට කාරක ප්‍රාග්ධනය පමණක් නියෝජනය වනසේ සමුච්චිත අරමුදල ගිණුම් ගතකර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂ වල ලබාගත් වාහන 14 ක් සහ යන්ත්‍ර අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.2,155,786 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,193,890 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) පොදු වෙළඳසැලෙන් සහ මස් වෙළඳ සැල්වලින් රු.530,210 ක් වූ හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට රු.253,000 ක් වූ අත්තිකාරම් බේරුම් නොකර පැවතුණි .

(ඇ) ගිණුම් වල දැක්වෙන රු.217,141 ක් වූ ඉඩම් බදු අයකර ගැනිම සඳහා සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) සේවකයින්ට දෙන ලද රු.489,550 ක් වූ ණය අයකර ගැනිම සඳහා දිර්ඝ කාලයක් තිස්සේ සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) රු.8,647 ක් වූ අගරු චෙක්පත් 3 ක වටිනාකම අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිග ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| (i). | වරිපනම් හා බදු | 10 | 06 | - |
| (ii). | බදු කුලී | 2,820 | 4,949 | 2,813 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 765 | 624 | - |
| (iv). | වෙනත් ආදයම් | 2,537 | 469 | - |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස 2011 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. 5,531,184 ක් සහ රු . 561,450 ක් අයවිය යුතුව තිබුණි .

2.4 මානව සම්පත් කළමනාකරණය

2.4.1 අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක ශ්‍රේණි | 01 | - |
| සහායක ශ්‍රේණි | 07 | 09 |
| සුළු ශ්‍රේණි | 16 | 15 |
| වෙනත් | - | 15 |
| | 24 | 39 |

2.5 සේවක ණය

2009 වර්ෂයේ දී මාරු කරන ලද වැඩ තහනම් කළ සහ තනතුරු හැර ගිය සේවකයින් 27 දෙනෙකු ගෙන් අයවිය යුතු රු . 844,570 ක් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

---

---

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

3 පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය